# තර්කය පිළිබඳ මධ්‍යමක සම්ප්‍රදායේ ආකල්පය: විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඊ.ඩබ්ලිව්.ජී. සජීව ප්‍රදීප් බණ්ඩාරනායක[1]

## හැඳින්වීම

මහායාන සම්ප්‍රදායේ ආරම්භක නිකාය ලෙස මධ්‍යමක ගුරුකුලය හැඳින්විය හැකි ය. සියුම් තර්කවාදයන්ගෙන් අගතැන්පත් සුප්‍රකට මහායාන ගුරුකුලය ලෙස එය සැලකේ. මධ්‍යමක සම්ප්‍රදායේ ආදි කතෘ නාගාර්ජුන නම් යතිවරයෙකි. උන්වහන්සේ පශ්චාත් බුද්ධ කාලීන බෞද්ධ දාර්ශනිකයන් අතර ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයෙක් ලෙස සලකනු ලබන අතර නාගාර්ජුනපාදයන් ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ පමණ ජීවත් වන්නට ඇතැයි අනුමාන කෙරේ. උන්වහන්සේගේ මූලික දර්ශනය වන්නේ ශූන්‍යතා දර්ශනයයි. සමකාලීනව උපන් විවිධ දුර්මතවලට දාර්ශනිකව පිළිතුරු දීමේ ප්‍රතිඵලයක් ලෙස ශූන්‍යතා දර්ශනය නිර්මාණය වී ඇත. ශූන්‍යතාවාදය ගොඩනගා ඇත්තේ පටිච්චසමුප්පාදය මත වන අතර එහි මූලික අපේක්ෂාව නම්, ධර්ම නෛරාත්මතාවය හා පරස්පරාපේක්ෂිත බව ප්‍රකට කිරීම යි.

නාගාර්ජුනපාදයන්ගේ කෘති අතරින් මූලමධ්‍යමකකාරිකාවට විශේෂ ස්ථානයක් හිමිවේ. එහි කතෘත්වය පිළිබඳ මත භේදයක් නොමැති අතර මධ්‍යමක දර්ශනය ඉදිරිපත් කරන ප්‍රාමාණික ග්‍රන්ථය ලෙස එය සලකනු ලැබේ. කාරිකාවේ මූලික අපේක්ෂාව සමකාලීන සමාජ පරිසරය තුළ පැවති ඉගැන්වීම් පරික්ෂා කිරීමයි. උන්වහන්සේ එම ඉගැන්වීම් තුළ පවතින විසංවාදි බව තර්කානුකූලව විවරණය කෙරේ. එසේ ම උන්වහන්සේ හේතුඵල සම්බන්ධය පිළිබඳ සමකාලීනව පැවති මතවාද හතර ප්‍රතික්ෂේප කරන්නේ ද තර්කයට සඅනුගත ව යි. දෘෂ්ටිවාද ඛණ්ඩනය සඳහා තර්කය යොදාගෙන ඇති මධ්‍යමකයෝ නිවැරදි ඥාන මාර්ගයක් ලෙස තර්කය පිළිගනු ලබයි ද ? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන අතර එහි ලා ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රයන් භාවිතා කරනු ලැබේ.

## සොයාගැනීම් සහ සාකච්ඡාව

කාරිකාව වනාහි මුල්බුදුසමයාගත ඉගැන්වීම් ක්‍රමානුකූල ව පිළිවෙළින් ඉදිරිපත් කිරීම උදෙසා සම්පාදනය කරන ලද්දක් නොවේ. කාරිකාවේ පරිච්ඡේද අතර අන්‍යෝන්‍ය වශයෙන් ඍජු සම්බන්ධයක් නොමැති අතර සමස්තයක් වශයෙන් ගත්කල කාරිකාව පුරාම ඇත්තේ සමකාලීන ඉගැන්වීම් තුළ පවතින සාවද්‍ය බව හා දෝෂ සහිත බව

1. sajeewapradeep1@gmail.com

සනාථ කිරීමේ අරමුණයි. තර්කය උපයෝගී කොටගනිමින් ධර්මාර්ථ විග්‍රහ කරන මධ්‍යමක කෘති අතර මූලමධ්‍යමකකාරිකාවට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. සමකාලීනයන් විසින් දාර්ශනික ලෝකයේ සූර්යා ලෙස ද, අනුබුදු නාමයෙන් ද හඳුන්වා ඇති ආචාර්ය නාගාර්ජුන පාදයෝ තර්කයෙහි අති දක්ෂයෙක් බව මූලමධ්‍යමකකාරිකාවෙන් මනාව සනාථ වේ.

පටිච්ච සමුප්පාදය මත පදනම් වූ සාපේක්ෂක සිද්ධාන්තය ඔස්සේ මුළු මහත් චිත්ත නිර්මිත සංකල්ප ලෝකයම මධ්‍යමකයෝ තර්කයට හසු කරති. හේතුව නැති නම් ඵලය ද, ඵලය නැති නම් හේතුව ද, හේතුව ඇත්නම් ඵලයද, ඵලය ඇත්නම් හේතුව ද යනාදී වශයෙන් අන්‍යෝන්‍ය සාපේක්ෂක බව තර්කානුකූලව පෙන්නුම් කරති. සමකාලීන චින්තකයන්ට බෞද්ධ ඉගැන්වීම් ඛන්ඩණය කරමින් සාවද්‍ය අන්තවාදයන්ට එළඹීම උදෙසා තර්කය හේතු වූ බව හඳුනාගත හැකිය. එහෙත් මධ්‍යමකයන් ඔවුන්ගේ ඉගැන්වීම් විග්‍රහ කිරීමෙහි හා සනාථ කිරීමෙහිලා තර්කය උපකරණාර්ථයෙන් ධර්මානුකූල සන්දර්භයක් තුළ භාවිතා කොට ඇති අයුරු කාරිකාවෙන් විද්‍යමාන වේ. ප්‍රණාම ගාථාවල මුල් කොටසින් පාරභෞතික අන්තවාද ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම තේමාවට අනුගත වෙමින් නාගාර්ජුනපාදයෝ තම කෘතියෙහි පළමු පරිච්ඡේද 25ම ද්විකෝටික හා චතුෂ්කෝටික හෝ සියලු ආකාරයේ පාරභෞතික මතවාද නිෂේධ කිරීම සඳහා කැප කරති.

ද්වෛතවාදීව ලොව දෙස බලා ද්වෛතවාදි සංකල්ප ගොඩනගා ගැනීමෙන් නිර්මාණය වන සංස්කාර යථාර්ථය දුරස් වීමට හේතු වේ. සියළු ආකාරයේ අන්තවාද බැහැර කිරීමෙන් ලොව පවතින යථාර්ථය සාක්ෂාත් කළ හැකිය. ඒ සදහා මධ්‍යම මාර්ග යෙහි ගමන් කළ යුතු ය. මෙම මධ්‍යම මාර්ගය චතුෂ්කෝටික තර්කයෙන් අප්‍රකාශිත වූවකි. බෞද්ධ සන්දර්භය තුළ යම් යම් ධර්ම කරුණු පැහැදිලි කොට දැක්වීමේ දී උපකරණාර්ථයෙන් චතුෂ්කෝටි ප්‍රකාශන භාවිත කොට ඇතත් එය යථාර්ථාවබෝධයට ප්‍රාමාණික නොවේ. විශේෂයෙන් යථාර්ථය සම්බන්ධ අවස්ථා සම්බන්ධය දැක්වීමේදී චතුෂ්කෝටික ප්‍රකාශන ප්‍රාමාණික නොවේ. යථාර්ථාවබෝධය භාෂාව පදනම්ව සිදු කෙරෙන තර්කයෙන් ලැබිය නොහැක්කක් වේ. භාෂාව හුදෙක් සන්නිවේදනයට භාවිතා කරන මෙවලමක් පමණි. ඒ ඔස්සේ ලොව පවතින සියල්ල අවබෝධ කළ හැකි යැයි සිතීම මුළාවකි. අනුභූතිය අනුව සකස්කර ගන්නා ලද භාෂාවෙන් පාරභෞතික තත්ත්වයක් වන නිර්වාණය විග්‍රහ කිරීම අසීරු ය. නිර්වාණය හෝ එම තත්ත්වයටපත් පුද්ගලයාගේ ස්වභාවය පිළිබඳව හෝ ප්‍රකාශ කිරීමට යාමේදි සංවෘති සත්‍යයට අදාළ භාෂාවේ එන යෙදුම් ප්‍රමාණවත් නොවේ. එසේ ප්‍රකාශ කිරීමට යාම තුළින් විවිධ අන්තවාද හා දෘෂ්ටිවාද නිර්මාණය වන බව මධ්‍යම ආකල්පයයි. බ්‍රහ්මජාල සූත්‍රයේ දැක්වෙන්නේ අනුභූතිය අනුව සකස් කරගන්නා ලද භාෂාමය තර්කය තුළින් සාවද්‍ය නිගමනවලට එළඹී නිසා උද්ගත වූ දාර්ශනික ව්‍යාකුලත්වකි.

යථාර්ථාවබෝධය වනාහි චින්තන විප්ලවයකින් සිදුවන්නක් මිස භාෂාමය හරඹයක් වන තර්කයෙන් සාක්ෂාත් කිරීම හෝ ප්‍රකාශ කිරීම කළ නොහැකිය. කෙසේ වුව ද අපෝහක පද්ධතියක් වශයෙන් චතුෂ්කෝටියෙහි ඇති වැදගත්කම බැහැර කළ නොහැකිය. නාගාර්ජුනපාදයන් පරවාදි අදහස් ඡේදනය කරන අසිපතක් ලෙස තර්කය භාවිතා කරමින් ඒවාට මුහුණ දිය හැකි ලෙස මුල් බුදුසමයාගත ඉගැන්වීම් විග්‍රහ කිරීමට හා සනාථ කිරීමට සාර්ථක ප්‍රයත්නයක් දරා ඇත.

තර්කය තුළින් එළඹෙන නිගමනයෙහි භව්‍යතා හතරක් විද්‍යමාන වන බව දක්වන බුදුසමය තර්කය පිළිගනු ලබන්නේ මූලික අවස්ථාවේදී පමණි. බුදුදහම අතක්කාවචරය. තර්කයෙන් පරම සත්‍ය අවබෝධ කළ නොහැකි ය. තර්කයට අනුව සත්‍ය වුවත් එය සැබෑ ලෝකය තුළ අසත්‍යක් විය හැකි ය. යමෙකුට අවශ්‍ය නම් තර්කය අන්තයට ගෙනගොස් බුදුන්, දහම්, සඟුන් වුවද නැතැයි යනුවෙන් තර්ක ගොඩනැගිය හැකි ය.

## නිගමනය

පරවාදී අදහස් බිඳහෙලීමට තර්කය යොදාගන්නා නාගාර්ජුනපාදයන් තර්කයේ පවතින දුර්වලතාවය ද කාරිකාවේදී පැහැදිලි කොට ඇත. කාරිකාව අවසානයේ නාගාර්ජුනපාදයෝ සර්ව දෘෂ්ටි ප්‍රහාණයම දේශනා කළ බුදුරජාණන් වහන්සේට ප්‍රණාම වන්දනාවක් සිදු කරති. ඒ තුළින් උන්වහන්සේගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ පරස්පරාපේක්ෂිත බව දක්වා සියළු ආකාරයේ අන්තවාද හා දෘෂ්ටිවාද දුරලීම බව පැහැදිලි වෙයි. ශූන්‍යතාවය වුවද දෘෂ්ටියක් කරගැනීම හානිදායකය. රෝගියෙකුට යම් ඖෂධයක් ලබාදුන් පසු ඔහුට එම ඖෂධයෙන් අන්‍ය වූ රෝගයක් වැළදේ නම්, එවැනි පුද්ගලයන් සුව කළ නොහැකි රෝගීන් ලෙස සැලකිය යුතු බව කාරිකාවේ සඳහන් වේ. බුද්ධ දේශනාව වශයෙන් සමකාලීන සම්ප්‍රදායයන් විසින් ඉදිරිපත් කළ ඉගැන්වීම් තුළ පවතින විසංවාදී බව සනාථ කිරීම සඳහා තර්කය උපයෝගි කොටගෙන ඇතත්, භාෂාමය තර්කය තුළින් යථාර්ථය සාක්ෂාත් කිරීම හෝ ප්‍රකාශ කිරීම සිදුකළ නොහැකි බව මධ්‍යමක සම්ප්‍රදායේ ආකල්පය බව හඳුනාගත හැකය. සමකාලීන දෘෂ්ටිවාද, අන්තවාද ප්‍රතික්ෂේප කිරීමටත්, පරස්පරාපේක්ෂිත වූ ලෝකයේ යථාර්ථය දැක්වීමටත් යොදාගෙන ඇති තර්කයේ උපයෝගීතාමය වූ සීමාවක් පවතී. ඉන් ඔබ්බට යාමට උත්සහ කිරීමෙන් සිදුවන්නේ සාවද්‍ය චින්තයක් පුද්ගල සන්තානය තුළ නිර්මාණය වීම බව තර්කය සම්බන්ධ මධ්‍යමක ආකල්පයයි. සැකෙවින් පවසතොත්, යථාර්ථය වෙත යොමු වීමේ ප්‍රාථමික උපාය මාර්ගයක් ලෙස තර්කය උපයෝගී කරගත හැකි නමුත් එයින් පරම සත්‍ය සාක්ෂාත් කිරීම හෝ ප්‍රකාශ කිරීම සීමිත වූ අරුත් සහිත භාෂාවෙන් හෝ භාෂාමය තර්කයෙන් සිදුකළ නොහැකි ය.

**මුඛ්‍ය පදඃ** තර්කය, නාගාර්ජුනපාදයෝ, මධ්‍යමක සම්ප්‍රදාය, මූලමධ්‍යමකකාරිකාව

## ආශ්‍රිත ග්‍රන්ථ

තිලකරත්න, අසංග, (2008). *ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නානායක්කාර, සනත්. (2003). *මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්,* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මේධානන්ද හිමි, දේවාලේගම. (1992). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය,* වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

විමලඤාණ හිමි, නාඔටුන්නේ. (2015). *බුද්ධිවාදී චින්තනය,* කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රීපති උක්වත්ත, සුමේධ විරාජ්. (2019). *ශූන්‍යතාවාදය,* නුගේගොඩඃ සංහිඳ ප්‍රකාශන.

කරුණාසේන, එම්. ඇස්. (1968). 'ථෙරවාද බෞද්ධ දර්ශනයේ ශූන්‍යතාවාදය'. *පටිපදා 18 කාණ්ඩය,* සංස්. සෝමසිරි කලුගෙදර.